# අම්මාගේ සෙනෙහස





තරුෂි විහංසා තෙන්නකෝන්

# අම්මාගේ සෙනෙහස

## තරුෂි විහංසා තෙන්නකෝන්

## කතෘගේ වෙනත් පොත්

දඟකාර හා පැංචා

අපේ අප්පච්චිගේ ගම

පාසල - මහාමයා බාලිකා විදුහල ,මහනුවර

පංතිය - **8 C**

**ISBN** 0978-624-211-462-0

# පිදුම

**මාගේ ආරණීය දෙමාපියන් වෙත**
**මෙම පොත ආදරයෙන්**
**පිළිගන්වමී.**



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

# අම්මාගේ ආදරය

සඳුනි අටවන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ශිෂ්‍යාවකි. ඇය ජීවත් වූයේ සතුටින් පිරුණු පවුලකය. පවුලේ සිටියේ අම්මා, තාත්තා සහ ඇයට වඩා අවුරුදු තුනක් කුඩා මල්ලි පමණි. ඔවුන්ගේ නිවස නිස්කලංක පරිසරයක පිහිටා තිබුණි.

සඳුනිගේ අම්මා පවුලේ සියලු දෙනා ගැන අදාරයෙන් කටයුතු කළ කෙනෙකි. උදේ පාන්දරින්ම නැගිට උදේ ආහාර සකස් කිරීම, දරුවන් පාසලට යැවීම, නිවසේ වැඩ කටයුතු කිරීම ඇයගේ දෛනික කටයුතු විය.

සෑම උදෑසනකම අම්මා වැඩකටයුතු කරන හඬ ඇසෙන විට සඳුනි ඇඳෙන් නැගිටියි. අම්මා හැමදාම සිනහවෙන් සිටියාය. එම නිසා නිවසේ අයත් සතුටින් සිටියහ.

සඳුනි පාසල් ගොස් නිවසට පැමිණි පසු අම්මා සමඟ දිනයේ සිදුවූ දේවල් කතා කිරීමට කැමති විය. අම්මාද එය හොඳින් අසා උපදෙස් ලබා දුන්නාය.

එක් උදෑසනක සඳුනි අවදි වූ විට නිවසේ අම්මාගේ හඬ ඇසුණේ නැත.

ඇය කුස්සියට ගියත් අම්මා එහි නොසිටියාය. පසුව කාමරයට ගිය විට අම්මා ඇඳ මත කෙදිරිගාමින් සිටින බව දැක්කාය.

“අම්මේ, මොකද ඔයාට?” සඳුනි ඇසුවාය.

අම්මා මඳ සිනහවක් දක්වමින්, “ටිකක් මහන්සියි දුවේ” යැයි පැවසුවාය.

මුලදී ඒ ගැන කිසිවෙකු වැඩි අවධානයක් නොදුන්නේය. නමුත් දින කිහිපයක් ගත වන විට අම්මාගේ ශරීරය තවත් දුර්වල විය.

නිවසේ කටයුතු අම්මා අතින් විය නොවුනි.

සඳුනි පළමු වතාවට තේරුම් ගත්තේ අම්මා කරන දේවල් කොතරම් විශාලද යන්නය.

ඒ දිනවල සිට සඳුනි උදේ කලින් නැගිටීමට පුරුදු විය.

ඇය මල්ලිව සූදානම් කළාය. පාසල් ඇඳුම් සකස් කළාය. උදේ ආහාරය සකස් කිරිමට තාත්තාට හැකි පමණ උදව් කළාය.

මුලදී සියල්ල අපහසු විය.

නමුත් අම්මාගේ මුහුණ දකින විට ඇය අධෛයර්යට පත් නොවීය.

පාසල් ගොස් පැමිණි පසු ඇය පාඩම් කිරීමට පෙර අම්මාට බෙහෙත් ලබා දුන්නාය.

අම්මාගේ දෑස්වල සතුටක් දිස්විය.

"දුවේ, ඔයාට මහන්සි නැද්ද?"

සඳුනි සිනාසෙමින්,

"අම්මේ, ඔයා ඉක්මනින් සනීප වුණාම මට මහන්සියක් නැහැ" යැයි කීවාය.

දින කිහිපයක් ගත වූ පසු අම්මාගේ අසනීප තත්ත්වය තවත් වැඩි විය. උදේ නැගිටීමටවත් අපහසු විය. තාත්තාත් කනස්සල්ලෙන් සිටියේය.

එක් දිනක සවස තාත්තා අම්මා වෛද්‍යවරයා වෙත රැගෙන ගියේය. පරීක්ෂා කිරීමෙන් පසු දින කිහිපයක් රෝහලේ සිට ප්‍රතිකාර ලබාගත යුතු බව වෛද්‍යවරයා පැවසීය.

ඒ වචන ඇසූ විට සඳුනිගේ හිතට දුකක් දැනුණි.

අම්මා නොමැති නිවසක් ඇයට කිසිදා හිතාගත නොහැකි දෙයක් විය.

අම්මා රෝහලට ගිය පසු නිවස පාලු විය.

එදින රාත්‍රියේ සඳුනි නිදාගන්න කලින් අම්මාගේ කාමරයට ගියාය. හිස්ව තිබූ ඇඳ දෙස බලා ඇයට දුකක් දැනුණි.

නමුත් ඇය මෙසේ සිතාගත්තාය—

“අම්මා සුව වෙලා එනකල් මම ශක්තිමත් වෙන්න ඕනේ.”

පසුදා උදේ සඳුනි අම්මා නැතුවම දවස පටන් ගත්තාය.

ඇය මුලින්ම කුස්සියට ගොස් තාත්තාට තේ එකක් සාදා දුන්නාය.

මල්ලිවත් සූදානම් කළාය.

ඇය පාසල් යන්න කලින් නිවස පිරිසිදු කළාය.

තාත්තා පුදුමයෙන් බලා සිටියේය.

“දුවේ, ඔයා ගොඩක් උදව් කරනවා.”

සඳුනි සිනාසෙමින් හිස සැලුවාය. තාත්තා ට වැද ඇය පාසලට ගියාය.

පාසලේදීත් ඇය ටිකක් නිහඬව සිටියාය.

ගුරුතුමිය ඇයගෙන් හේතුව ඇසූ විට ඇය අම්මා ගැන පැවසුවාය.

ඇගේ ගුරුතුමිය ඇයව ධෛයර්ය මත් කළේය.

පාසල් අවසන් වූ පසු සඳුනි සහ තාත්තා රෝහලට ගියාය.

අම්මා ඇඳ මත නිහඬව සිටියාය.

සඳුනි අම්මා අසලට ගොස් අත අල්ලා ගත්තාය.

"අම්මේ, අපි හොඳින් ඉන්නවා."

අම්මා මඳක් සිනාසුණාය.

"දුවේ, පාඩම් අතහැර ගන්න එපා."

"නැහැ අම්මේ."

ඇය පාසලේ කටයුතු හොඳින් සිදුකළ බව අම්මාට කියා දුන්නාය.

අම්මාගේ මුහුණේ සතුටක් දිස් විය.

පාසලේ වාර විභාගය ලන්ව තිබුණි.

නිවසේ වැඩ, පාඩම් සහ රෝහලේ යාම එකවර කළ යුතු වූ නිසා සඳුනිට වෙහෙසක් දැනුණි.

ඇය රාත්‍රියේ පාඩම් කරන අතරතුර නින්දට වැටුණාය.

උදේ නැගිට ඇයට කනගාටුවක් ඇති විය.

නමුත් ඇය අත්හැරියේ නැත.

තාත්තා මේසේ පැවසුවේ—

“අපි හැමෝම එකට මේක ජය ගන්නවා.”

එම වචන සඳුනිට ලොකු ශක්තියක් විය.

සති දෙකකට පසු වෛද්‍යවරයා හොඳ ආරංචියක් දුන්නාය.

අම්මාගේ සෞඛ්‍ය තත්ත්වය ටිකෙන් ටික යහපත් වෙමින් තිබුණි.

සඳුනි සතුටින් සිනාසුණාය.

ඇය එදාම නිවසට පැමිණ අම්මා වෙනුවෙන් ලස්සන සටහනක් ලියා තැබුවාය.

**“අම්මේ, අපි ඔයා එනකල් බලාගෙන ඉන්නවා.”**

එදින පසු සඳුනිගේ සිතේ අලුත් බලාපොරොත්තුවක් ඇති විය. වෛද්‍යවරයා පැවසූ වචන ඇගේ සිතට ලොකු සැනසීමක් ගෙන ආවේය.

ඇය සෑම දිනකම පාසල් ගොස් පැමිණි පසු රෝහලට ගියාය..

අම්මාද සෑම දිනකම ටිකෙන් ටික ශක්තිමත් විය.

එක් දිනක අම්මා සඳුනිගෙන් ඇසුවාය—

“දුවේ, නිවසේ වැඩ ඔක්කොම හරියට කරනවද?”

සඳුනි සිනාසුණාය.

“ඔයා කරපු තරම් හොඳට බැරි වුණත් උත්සාහ කරනවා.”

අම්මාගේ දෑස් තෙත් විය.

පාසලේ වාර විභාගයපැවැත්වීමට නියමිත විය.

සඳුනිටත් සහභාගී වීමට අවශ්‍ය විය.

නමුත් ඇයට සිතුණේ—

“මම මේ වෙලාවේ අම්මා ළඟ ඉන්න ඕනේ.”

ඇගේ පන්ති භාර ගුරුතුමිය මේ ගැන දැනගත්තාය.

ගුරුතුමිය පැවසුවාය—

“පවුල ගැන හිතන එක හොඳයි. හැබැයි ඔයාගේ හීනත් අමතක කරන්න එපා.”

ඒ වචන සඳුනිට අලුත් ශක්තියක් විය.

ඇය වාර විභාගයට සූදානම් වීමට තීරණය කළාය.

එක් සවස තාත්තා රෝහලෙන් පැමිණියේ සතුටින්ය.

"අම්මාට තව දවස් දෙකකින් ගෙදර එන්න පුළුවන්."

එය ඇසූ විට මල්ලි උඩ පැන සතුටු විය.

සඳුනි නිවස පිරිසිදු කළාය.

අම්මාගේ කාමරය ලස්සනට සකස් කළාය.

ඇය කුඩා කඩදාසියක මෙසේ ලියා ඇඳ අසල තැබුවාය—

**"අම්මේ, අපේ ගෙදර ආයෙත් සම්පූර්ණ වෙන්න යන්නේ."**

අම්මා නිවසට පැමිණි දවස විශේෂ දිනයක් විය.

තාත්තා අම්මා ගෙදරට ගෙන ආවේය.

අම්මා නිවස පුරා බැලුවාය.

සියල්ල පිළිවෙළට තිබුණි.

කුස්සියත් පිරිසිදුව තිබුණි.

අම්මා පුදුමයෙන් සඳුනි දෙස බැලුවාය.

"මේ හැමදේම ඔයාද කළේ?"

සඳුනි හිස සෙමින් සොලවා සිනාසුණාය.

අම්මා ඇයව තදින් වැළඳ ගත්තාය.

අම්මා සුව වුණාට පසුවත් සඳුනි කලින් වගේ සියලු වැඩ අම්මාට පමණක් භාර දුන්නේ නැත.

ඇය උදේට උදව් කළාය.

මල්ලිත් තමන්ගේ වැඩ තමන් ම කිරීමට පුරුදු විය.

තාත්තාත් වැඩිපුර නිවසේ කටයුතු වලට සහභාගී විය.

එදායින් පසු ඔවුන් තේරුම් ගත්තේ—

පවුල කියන්නේ එකිනෙකාට උදව් කරන තැනක් බවයි.

අම්මා සුවය ලබමින් සිටි නිසා සඳුනිගේ හිතත් සැහැල්ලු විය. දැන් ඇයට පාසල් වැඩවලට වැඩි අවධානයක් දීමට හැකි විය.

එක් දිනක පාසලේ ගුරුතුමිය ඇය අමතා,

“සඳුනි, ඔයා මේ දවස්වල හොඳින් වැඩ කරනවා” යැයි කීවාය.

ඇය මඳ සිනහවක් පෑවාය.

ඇයට දැන් තේරුණේ ජීවිතයේ අපහසු කාලයන් අතරත් ඉගෙනීම නතර නොකළ යුතු බවයි.

අම්මා නිවසට පැමිණ සතියක් ගත වූ පසු මල්ලි අදහසක් ඉදිරිපත් කළේය.

“අම්මා සුව වුණ එක සමරමු.”

සියලු දෙනා එකඟ වූහ.

සඳුනි කඩදාසි මල් සාදා නිවස අලංකාර කළාය.

තාත්තා කුඩා කේක් එකක් ගෙන ආවේය.

අම්මා ඒ සියල්ල බලා සතුටින් සිනාසුණාය.

“මට මේක ලොකු තෑග්ගක්.අම්මා කිව්වාය.”

විභාග දිනය පැමිණියාය.

සඳුනිට ටිකක් බියක් දැනුණි.

ඇය අම්මා ළඟට ගියාය.

“ඔයා උත්සාහ කළා. ඒකම ප්‍රමාණවත්.”

එම වචන ඇයට ධෛර්යක් විය.

වාර විභාගය අවසන් වූ විට ඇයට සැහැල්ලුවක් දැනුණි.

සති කිහිපයකට පසු ප්‍රතිඵල නිකුත් විය.

සඳුනි හොඳ ලකුණු ලබාගෙන තිබුණාය.

ඇය නිවසට දුවගෙන ගොස් ප්‍රගති වාර්තාව අම්මාට පෙන්වීය.

අම්මා සතුටින් ඇය වැළඳ ගත්තාය.

“මේ ජයග්‍රහණය ඔයාගේ මහන්සියේ ප්‍රතිඵලයක්.”

දිනක් සවස සඳුනි වත්තේ සිට අහස දෙස බලා සිටියාය.

අම්මා අසනීප නොවුණා නම් තමන්ට මේ තරම් දේවල් ඉගෙන ගන්න ලැබෙන්නෙ නැති වෙයි.

එදින රාත්‍රියේ සියලු දෙනා එකට වාඩි වූහ.

තාත්තා පැවසුවේ—

“ඉදිරියට අපි හැමෝම වැඩ බෙදාගෙන කරමු.”

සියලු දෙනා එකඟ වූහ.

සඳුනි සිනාසුණාය.

නිවසේ නැවත සතුට පිරී තිබුණි.

අම්මා කුස්සියට ගියත් දැන් ඇය තනිව වැඩ කළේ නැත.

සඳුනි අසලින් උදව් කළාය.

මල්ලිත් තම කොටස කළේය.

අම්මා ඒ සියල්ල බලා සිනාසුණාය.

කාලය ටිකෙන් ටික ගෙවී ගියේය. අම්මාගේ සෞඛ්‍ය තත්ත්වය සම්පූර්ණයෙන්ම යහපත් විය. නිවසේ සියලු දේ නැවත සාමාන්‍ය තත්ත්වයට පැමිණ තිබුණි.

නමුත් එක් දෙයක් වෙනස් වී තිබුණි.

සඳුනි.

කලින් පාසල් ගොස් සෙල්ලම් කරමින් සිටි කුඩා දැරිය දැන් වගකීම් දන්නා, පවුලේ වටිනාකම තේරුම් ගත් දරුවෙකු බවට පත්වී තිබුණාය.

එක් සෙනසුරාදා උදෑසන අම්මා වත්තේ මල් පැළ වලට වතුර දමමින් සිටියාය. සඳුනිත් අසලට පැමිණියාය.

"අම්මේ, මටත් කරන්න දෙන්න."

අම්මා සිනාසුණාය.

දෙදෙනාම එකට වත්තේ වැඩ කළහ.

ටික වෙලාවකට පසු අම්මා මෙසේ කීවාය.

"දුවේ, මට අසනීප වුණ එක අපහසු කාලයක්. ඒත් ඒ කාලයේ මට ලැබුණු ලොකුම දෙය ඔයාගේ ආදරය."

සඳුනි නිහඬව අසා සිටියාය.

“මම කලේ කරන්න ඕන දේ විතරයි අම්මේ.”

අම්මා ඇයව වැළඳ ගත්තාය.

එදින සවස නිවසේ සියලු දෙනා එකට තේ පානය කළහ.

කතා කළහ. සිනාසුණහ.

තාත්තා සඳුනි දෙස බලා මෙසේ කීවේය—

“ඔයා අපිට ලොකු උදව්වක් කළා.

අපි හැමෝම එකට හිටිය නිසා මේ කාලය ජය ගත්තා.”

ඇයට දැන් තේරුණේ ජීවිතයේ වටිනාම දේ මුදල් හෝ දේපළ නොවෙයි කියාය.

**අසීරු වෙලාවක එකිනෙකා ළඟ සිටින පවුල තමයි ලොකුම ශක්තිය.**

එදා සිට ඔවුන්ගේ නිවසේ වැඩ බෙදාගෙන කළහ. කෙනෙකුට අමාරු වෙලාවක අනෙක් අය උදව් කළහ.

අම්මා නැවතත් කලින් වගේම සිනාසෙමින් ජීවත් වූවාය.

සඳුනි සෑම දිනකම ඒ සිනහව දැක සතුටු වූවාය.

ඇය හිතා මෙසේ සිතුවේය.

**“අම්මාගේ සිනහව රැක ගන්න මම හැමදාම උත්සාහ කරනවා.”**





**තරුෂි විහංසා තෙන්නකොන්**

**පාසල - මහාමයා බාලිකා විදුහල ,මහනුවර**

**පංතිය - 8 C**

**ISBN** 0978-624-211-462-0

## පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්යය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)